සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

**ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය 2019 (II)**

| | | |
|---|---|---|
| **කාලය: පැය 03** | **රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය (04)** | විභාග අංකය<br>Index No / சுட்டெண்<br>.................................... |

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

1. i. ඒකාබද්ධ අරමුදලට කරනු ලබන ගෙවීම් හා එම අරමුදලෙන් මුදල් ඉවත්කර ගැනීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇති විධිවිධාන කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

   ii. මු.රෙ. 66 යටතේ වීරමොං ක්‍රියාපටිපාටිය උචිත නොවන අවස්ථා දක්වන්න. (ලකුණු 12)

2. i. මු.රෙ. 102 ප්‍රකාරව නැතිවීම්/හානි යන්නට ඇතුළත් වන හානි සඳහන් කරන්න. (ලකුණු 10)

   ii. දෙපාර්තමේන්තුවක සිදුවී ඇති වාහන අනතුරක් සම්බන්ධයෙන් මු.රෙ. 103(I) ප්‍රකාරව කටයුතු කළයුතු ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 10)

3. i. මු.රෙ. 124(2) ප්‍රකාරව "සෑම අමාත්‍යාංශ ලේකම්වරයෙක්ම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙකු වන අතර සෑම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියෙක්ම අමාත්‍යාංශ ලේකම්වරයෙකු නොවේ" විග්‍රහ කරන්න. (ලකුණු 08)

   ii. මු.රෙ. 135 පරිදි මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීමේදී ගණන්දීමේ නිලධාරියා සැළකිලිමත් විය යුතු කරුණු සැකෙවින් දක්වන්න. (ලකුණු 12)

4. i. ව්‍යවස්ථාපිත විගණනය හා අභ්‍යන්තර විගණනය අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. ඔබ ආයතනයට ලද විගණන විමසුමක් සම්බන්ධයෙන් ක්‍රියා කළයුතු ආකාරය මුදල් රෙගුලාසි ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

5. i. ප්‍රසම්පාදන ක්‍රියාවලියට සහය වන කමිටු වර්ග තුනක් (03) නම් කරන්න. (ලකුණු 06)

   ii. සෘජු කොන්ත්‍රාත් ක්‍රමය භාවිත කිරීම වඩාත් උචිත වන අවස්ථා තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 06)

   iii. ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී භාවිත වන "ලංසු සුරක්ෂණය (Bid Security)" හා "කාර්යසාධන සුරක්ෂණය (Performance Security)" අතර වෙනස පහදන්න. (ලකුණු 08)

6. කෙටි සටහන් ලියන්න.

i. සාමූහික ප්‍රතිපාදන (Block Provision)

ii. ඉකුත් ගෙවීම්

iii. අභ්‍යන්තර පාලනය

iv. ප්‍රසම්පාදන අස්ථිත්වය (Entity)

(ලකුණු 5X4 = 20)

**************